කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

**ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය- 2017/18**
**SOC 3267 - අධ්‍යාපනය සහ සමාජය**
**පැ දෙක (02) යි**

**ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.**

---

1. අධ්‍යාපනය, සමාජ ව්‍යුහයේ තිබෙන සෙසු සමාජ සංස්ථා සමඟ පවත්වන සම්බන්ධතාවයේ ස්වභාවය විග්‍රහ කිරීම අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාඥයාගේ කාර්යභාරය වන්නේයැයි ඔබ සිතනවාද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

2. පාසලෙන් සමාජයට ඉටු වන කෘත්‍ය පිළිබඳව කෘත්‍යවාදීන් කළ සාකච්ඡාව විචාරාත්මකව අගයන්න.

3. 'පන්ති කාමරයක් ශිෂ්‍ය කේන්ද්‍රීය කරවීමට නම් ගුරුවරයාගේ සහ සිසුන්ගේ ආකල්පවල විශාල වෙනසක් සිදුවිය යුතුය.' මෙම අදහස ජෝන් ඩූවීගේ අදහස් ඇසුරින් විචාරාත්මකව සාකච්ඡා කරන්න.

4. 'පවත්නා ධනවාදී සමාජ ක්‍රමය තුළ පාසල භාණ්ඩයක් බවට පත්වීමත් විවිධ පාසල්වලට සම්පත් බෙදීයාමේ විෂමතා ඇතිවීමත් නොවැළැක්විය හැකිය.' ඔබ එකඟ වනවාද? ඔබගේ පිළිතුර ශ්‍රී ලාංකේය උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

5. මිශ්‍ර මාධ්‍ය හරහා ඉගෙන ගැනීමේ විධික්‍රමය (blended learning mode) පන්ති කාමරයට හඳුන්වා දීමට ලෝකය පුරා ඇති උද්යෝගය නිසා ගුරුවරයාගේ භූමිකාවට හිමි වී ඇති වැදගත්කම අඩු වී යනු ඇතැයි ඔබ සිතනවාද? ඔබගේ අත්දැකීම් ඇසුරින් විචාරාත්මකව විභාග කරන්න.

6. සාම්ප්‍රදායික පන්ති කාමරයකට හුරු වී සිටින සිසුන් ස්වාධීනව තොරතුරු ගවේෂණය කරමින් ඉගෙන ගැනීමට කැමති සිසුන් බවට පත් කිරීම සඳහා ඔබ ඉදිරිපත් කරන යෝජනා මොනවාද? ඔබගේ අත්දැකීම් සහ න්‍යායාත්මක දැනුම ඇසුරින් සාකච්ඡා කරන්න.

**************************